**/පිටබැද්දර ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**---------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කර්මාන්ත 10 කට අදාළව ගෙවිය යුතු හා ලැබිය යුතු රු.30,560,772 ක මුදල ණයගැති හා ණයහිමි ගිණුම්වලින් මෙන්ම ප්‍රාග්ධන ආධාර සහ ප්‍රාග්ධන වියදම් වලින්ද අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,427,035 ක වියදමින් නිමකර තිබූ ඉදිකිරීම් 04 ක වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි

(ඇ) මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සභාවේ බැකෝ රථය යොදාගෙන නිමකර තිබූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.45,000 ක මුදල ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන වියදම් ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) පසුගිය වසරේ අඩුවෙන් ඇස්තමේන්තුගත කර තිබූ රු. 3,384,242 ක් වූ මුද්දර ගාස්තු ආදායම, නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අදාළ ගැලපීම් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.283,500 ක හිඟ කසළ බදු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පසුගිය වසරේ ප්‍රාග්ධන වියදම් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබූ රු.1,225,940ක මුදල නිවැරදි කිරීමේදී ද්විගණනය වී තිබුණි.

(උ) වැඩ අවසන් කර තිබූ රු. 2,950,168 ක් වටිනා කර්මාන්ත 05 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු.211,846 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ජ'ර්නල් සටහන් 03 ක එකතු වටිනාකම රු.132,030 ක් හර හා බැර සටහන් මාරු කර දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

------------------------

මූලා‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 16 කට අදාළ ශේෂ හා ඊට අදාල උපයෝගී ලේඛන / උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.45,095,999 ක් විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.38,613,411 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.24,782,274 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.40,365,979 ක් වූ ප්‍රාග්ධන වියදම් ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.25,744,847 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතු කළ අගය මත බදු ගිණුමේ වූ රු.624,939 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.41,821,685 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 අනුකූල නොවීම

### 1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 571 | වර්ෂ 03ක කාලයක් ඉකුත් වූ, රු.919,377 ක ගෙවිය යුතු රැඳවුම් තැන්පතු ශේෂ 83 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.102 - 112 | 2016 ජූලි 01 දින අනතුරට ලක්වී තිබූ රථයේ අනතුර සම්බන්ධව හානි හා පාඩු වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර රථයේ අළුත්වැඩියා වියදම් ලෙස රු.194,630 ක් ගෙවා තිබුණි. රක්ෂණ වන්දි ලබා ගැනීමෙන් අනතුරුව තවදුරටත් රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.17,502 ක් විය. හානි හා පාඩු පිළිබඳ ලේඛනයක්ද පවත්වා නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2017 වර්ෂය සඳහා සභාවට අයත් වාහන 09 සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,503,867 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,368,175 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,158,750 | 1,452,395 | 1,444,348 | 265,441 | 1,040,750 | 1,115,543 | 1,087,682 | 257,394 |
| කුළී | 4,448,000 | 5,715,998 | 5,256,984 | 1,662,458 | 4,303,000 | 5,391,823 | 5,591,798 | 1,203,444 |
| බලපත්‍ර ගාස්තු | 305,100 | 312,923 | 312,923 | 70,522 | 232,100 | 238,287 | 238,287 | 70,522 |
| වෙනත් ආදායම් | 10,821,000 | 12,134,615 | 9,376,183 | 16,414,597 | 11,282,500 | 14,673,155 | 6,556,234 | 13,656,165 |
| -එකතුව- | 16,732,850 | 19,615,931 | 16,390,438 | 18,413,018 | 16,858,350 | 21,418,808 | 13,474,001 | 15,187,525 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.16,732,850 ක් වූ අතර බිල් කළ ආදායම රු.19,615,931 ක් විය. රු.15,187,525 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.34,803,456 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.16,390,438 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.18,413,018 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

(අ) වරිපනම්

2010 පෙබරවාරි 28 දිනැති අංක 1824 දරන ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 10 ක් දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශ කර තිබුණද, 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සභාව විසින් වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

(ආ) අක්කර බදු

ආරම්භක හිඟය රු.256,749 ක් වූ අතර, රු.31,883 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමග රු. 288,632 ක් අය විය යුතුව තිබුණි. මුළු අයවීම් රු.23,191 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.265,441 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ඇ) ජල ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ආරම්භක හිඟය රු.959,589 ක් වූ අතර, රු.771,747 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.1,731,336 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.796,816 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.961,520 ක් හිඟව පැවතුණි. 2011 වර්ෂයේ සිට අක්‍රියව තිබූ අලපලාදෙනිය ජල ව්‍යාපෘතියෙන් රු.351,171 ක මුදලක් අයවීමට තිබුණි.

(ii) ජල පාරිභෝගිකයන් 140 දෙනෙකුගෙන් අයවිය යුතු රු.373,099 ක හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ජල පාරිභෝගිකයන් 391 ක් සමඟ ගිවිසුම් අත්සන් කරගෙන නොතිබුණි. ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සහ වැටුප් හා දීමනා ලෙස රු.2,333,966 ක් ගෙවා තිබුණද, ආදායම ලෙස රු.796,816 ක් පමණක් ලැබී තිබීම නිසා ජල ව්‍යාපෘති නඩත්තුවෙන් සභාවට රු.1,537,150 ක පාඩුවක් සිදුවී තිබුණි.

**2.2.4 කුලී**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟය රු.581,139 ක් වූ අතර, රු.3,981,993 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.4,563,132 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,536,804 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,026,328 ක හිඟ ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ හිඟ මුදලින් වාරික 10ට වැඩි හිඟ මුදලක් පවතින කඩ හිමියන් 14 දෙනෙකුගෙන් රු.644,152 ක

මුදලක් අයවීමට පැවති අතර, ඔවුන් සමඟ ඇති කර ගෙන තිබූ ගිවිසුම් අක්‍රීය තත්ත්වයෙන් පැවතුණි.

(ආ) මොරවක සඳුදා සතිපොළ හා මාළු ලෑල්ල බදු දීමේ ටෙන්ඩරය 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.1,056,550 හා රු.772,200 ක් වී තිබුණද, එම මුදල අවම ලංසුව ලෙස 2017 වර්ෂයට ප්‍රකාශ නොකිරීම නිසා 2017 වර්ෂයට ටෙන්ඩර් කිරීමේදී 2016 වර්ෂයට වඩා පිළිවෙලින් රු.108,500 ක සහ රු.810,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,443,470 ක් හා මුද්දර ගාස්තු රු.13,900,606 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

-------------------------------------

2017 වර්ෂයේ රු.25,098,000 ක් වූ අයවැයගත වැඩ යෝජනා 68 ක් සහ අරමුදල් හා වෙනත් ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද 2017 වර්ෂය අවසාන වන විට ඉන් කිසිඳු වැඩ යෝජනාවක් හෝ ඉටුකර නොතිබුණි. අයවැය යෝජනා මඟින් අනුමත වී නොතිබූ කර්මාන්ත 14 ක් වෙනුවෙන් රු.15,525,931 ක් විවිධ ප්‍රතිපාදන යටතේ වැයකර තිබුණි.

### (ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල 2014 වර්ෂය තුළ ඉදි කිරීමේදී රු.260,041 ක් වූ වැඩ විෂයන් 13 ක් සම්පූර්ණයෙන් අත්හැර තිබුණි. ඉටු කරන ලද වැඩ විෂයන් 05 ක ඇස්තමේන්තු වැඩ වටිනාකම රු.1,787,193 ක් වුවද, ඉටු නොකළ වැඩ වටිනාකම රු.854,147 ක් විය. අදාළ කර්මාන්තයේ ඇස්තමේන්තුවේ සඳහන් නොවූ වැඩ විෂයන් වෙනුවෙන් රු.84,574 ක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ කර්මාන්තය ඉටු කර නොතිබූ නමුත්, අදාළ කර්මාන්තයේ කළ වැඩ වටිනාකම මත රු.1,423,429 ක මුදලක්ද, රු.201,213 ක රැඳවුම් මුදල හා ලංසු ඇපකර ද නිදහස් කර තිබුණි. 2013 වර්ෂයේදී රු.1,423,429 ක් වැය කර කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහලේ කොටසක් ඉදි කර ඉතිරි වැඩ අවසන් නොකිරීම නිසා බිම් මහලේ පැවැත්මට හානි වී තිබූ අතර කර්මාන්තයේ අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගෙන නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------

සභාවට අයත් ටොන් 08 ක හා ටොන් 04 ක මාර්ග තලන යන්ත්‍ර සමාලෝචිත වර්ෂය තුළ දෛනිකව රු.10,000 ක් ගෙවීමේ පදනම මත පිළිවෙලින් දින 29 ක් හා දින 30 ක් කුලියට දී තිබූ අතර, යන්ත්‍ර කුලියට දීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකසා නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) අනුමත සේවක සංඛ්‍යා සැළැස්මේ වූ පුරප්පාඩු 04 ක් සම්පූර්ණකර ගැනීමටත්, 10 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කණිෂ්ඨ සේවකයන් 13 දෙනෙකු නියමිත රාජකාරිවලින් බැහැරව වෙනත් රාජකාරි සඳහා යොදවා තිබූ බැවින්, කණිෂ්ඨ සේවයේ රාජකාරි ආවරණය කිරීමට බඳවාගත් කම්කරුවන් වෙනුවෙන් වැටුප් හා අතිකාල ලෙස රු.1,564,143 ක මුදලක් ගෙවා තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

------------------------------------------

සභාව සතු ඉඩම් 04 ක සහ ගොඩනැගිල්ලක අනවසර වගාකරුවන් සහ පදිංචිකරුවන් සිටියද, සභාව විසින් ඒ පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.4.2 පවරා නොගත් වත්කම්**

------------------------

සභාව සතු රු.22,016,131 ක් වටිනා ඉඩම් කැබලි 15 ක අයිතිය සහ ප්‍රමාණය තහවුරු කරගෙන නොතිබුණි.

**3.4.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

(අ) රු.16,329,104 ක් වටිනා ඉඩම 05ක් හා කඩ කාමර 05 ක් කිසිඳු ප්‍රයෝජනවත් කාර්යයක යොදවා නොතිබුණි.

(ආ) සභාවට අයත් රු.210,000 ක් වටිනා අත් ට්‍රැක්ටරය හා රු.281,925 ක් වටිනා ත්‍රිරෝද රථය වර්ෂය තුළ කිසිඳු ධාවනයක් සිදුකර නොතිබූ අතර, රු.156,520 ක් වටිනා යතුරු පැදිය කිලෝමීටර් 21.5 ක් පමණක් ධාවනය කර තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ඩබල් කැබ් රථය 2017 වර්ෂය තුළ කිලෝමීටර් 50270 ක් ධාවනය කර තිබූ අතර, ඉන්ධන වියදම් ලෙස රු.551,583 ක් වියදම් දරා තිබුණි. නියදි පරීක්ෂාව අනුව 2017 වර්ෂයේ මාර්තු මාසයේ ධාවනය කල කිලෝමීටර් සංඛ්‍යාවෙන් බල ප්‍රදේශයේ රාජකාරි සඳහා ධාවනය කර තිබුනේ කිලෝමීටර් 837 ක් පමණක් වූ අතර, පෞද්ගලික පරිහරණය සඳහා භාවිතා කල කිලෝමීටර් ගණන 2764 ක් විය.

(ආ) සභාවට අයත් නව බැකෝ රථයේ ඉන්ධන දහන පරීක්ෂාව අනුව අනුමත යන්ත්‍ර පැය ප්‍රමාණයට වඩා පැය 48 ක් වැඩියෙන් භාවිතා කිරීම නිසා රු.162,833 ක අමතර ඉන්ධන වියදමක් දරා තිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 සැපයීම් හා සේවා

පිටබැද්දර ප්‍රාදේශීය සභාව පවත්වාගෙන යන ගොඩනැඟිල්ලේ ඉහළ මහල ඉදිකිරීම සඳහා අදාළ කර්මාන්තයේ කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවීමේ සිට ගිවිසුම්ගත වීම දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අනුගමනය කර නොතිබුණි.

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

සභාවට අයත් බහුකාර්ය ගොඩනැඟිල්ලේ ප්‍රවේශ මාර්ගය ඉදි කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන අයුරින් කර තිබූ වැඩ වෙනුවෙන් රු.386,029ක මුදලක් ගෙවීම් කර තිබුණි. රු.211,815 ක් වූ වැඩ විෂයන් 04 ක වැඩ කොටස් ඉටු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 06 ක ඉතිරි කිරීම්වල එකතුව රු.1,739,358 ක් වූ අතර එම අගයන් සියයට 06 සිට සියයට 64 අතර පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 02 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.2,933,480 ක් වූ අතර එම අගයන් සියයට 04 සිට සියයට 67 අතර පරාසයක පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය